**ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් සභාව සතු ඉඩම් 22 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | වත්කම් ලේඛනයේ ඇතුලත් කර ඇති සභාව සතු ඉඩම් වලට අදාළ පිඹුරු පත් පිළියෙල කර තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු වාර්තා ලබා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට තොග ලේඛනය අනුව තොග අයිතම් 05 ක වටිනාකම වූ රු. 75,145 ක් වැඩියෙන් හා තොග අයිතම් 19 ක වටිනාකම වූ රු. 30,628 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතු වේ. | 2019 වර්ෂයේදී ජ'නල් සටහන් අංක 02, 03 මඟින් නිවැරදි කර ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සභාවේ කසළ කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා දරන ලද රු. 1,858,720 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිකිරීම් පිරිවැය ප්‍රාග්ධනිත කළ යුතු වේ. | 2019 වර්ෂයේදී ජ'නල් සටහන් අංක 10 මඟින් නිවැරදි කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු ගිණුම් 03 කට අදාල එකතුව රු. 16,736 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර පළාත් සභාවෙන් ලැබිය යුතු රු. 989,262 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ලැබීම් හා ගෙවීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේදී ජ'නල් සටහන් අංක 12 මගින් නිවැරදි කර ඇත. |
| (ඉ) | 2016 වර්ෂයේදී රු. 119,046 ක විදුලි ගාස්තු අත්තිකාරමක් ලෙස ගිණුම්ගත කිරීම නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අත්තිකාරම් ගිණුම හර කර සමුච්චිත අරමුදල බැර කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2019 වර්ෂයේදී ජ'නල් සටහන් අංක 19 මගින් නිවැරදි කර ඇත. |
| (ඊ) | 2017 වර්ෂයේදී ඉදිකිරීමක් සඳහා ගෙවන ලද රු. 329,363 ක් අත්තිකාරමක් ලෙස ගිණුමගත වීම සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීම සඳහා අත්තිකාරම් ගිණුම හර කර සමුච්චිත අරමුදල බැර කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2019 වර්ෂයේදී ජ'නල් සටහන් අංක 20 මගින් නිවැරදි කර ඇත. |
| (උ) | 2017 වර්ෂයේදී කසළ කළමනාකරණ ව්‍යාපෘතියට ලැබුණු තැන්පතු ලෙස ගිණුම්ගත කරතිබු රු 560,300 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදීවත් ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2019 වර්ෂයේදී ජ'නල් සටහන් අංක 21 මගින් නිවැරදි කර ඇත. |
| (ඌ) | 2016 වර්ෂයේ මුද්දර ගාස්තු උපලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් උසාවි කාර්යය මණ්ඩලයට ගෙවිය යුතු කාර්යය මණ්ඩල දීමනා රු. 115,900 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2019 වර්ෂයේදී ජ'නල් සටහන් අංක 16 මගින් නිවැරදි කර ඇත. |
| (එ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට විවිධ තැන්පතු ලේඛනයේ කේවල ශේෂ හා විවිධ තැන්පතු පාලන ගිණුමේ ශේෂය අතර රු. 7,671,047 ක වෙනසක් විය. | නොසැසඳීම් හඳුනාගෙන නිවැරදිව ගැලපිය යුතු වේ. | තැන්පතු ලේඛනයට අනුව 2018 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. 110,436 ක් වූ තැන්පතු මුදල ඉදිරියේදී නියාදනය කිරීමට කටයුතු කරමි. |
| (ඒ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට අත්තිකාරම් ලේඛනයේ නොපියවූ ශේෂ හා අත්තිකාරම් පාලන ගිණුමේ ශේෂය අතර රු. 3,427,173 ක වෙනසක් විය. | නොසැසඳීම් හඳුනාගෙන නිවැරදිව ගැලපිය යුතු වේ. | නොපියවී ඇති අත්තිකාරම් මුදල ඉදිරියේදී පියවීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ණයගැති ලේඛනයේ කේවල ශේෂ හා ණයගැති පාලන ගිණුමේ ශේෂය අතර රු. 3,308,666 ක වෙනසක් විය. | නොසැසඳීම් හඳුනාගෙන නිවැරදිව ගැලපිය යුතු වේ. | කේවල ශේෂ ලැයිස්තුවේ එකතුව රු. 5,905,056 ක් වූ අතර ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 9,213,722 ක් වීමෙන් ගිණුම් තැබීමේදී ණයගැති වෙන්කිරීම් වෙනුවෙන් ලද මුදල් ණයගැතියන්ට බැර නොකිරීම නිසා රු. 3,308,666 ක වෙනසක් ඇති වී ඇත. එය ජර්නල් සටහන් අංක 23 මඟින් 2019 වර්ෂයේදී නිවැරදි කර ඇත. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | වටිනාකම රු. | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ | | | | |
| (i) | 24 (1) (අ) හා (ආ) වගන්ති | සභාව සතු මාර්ග ගැසට් කිරීමට හෝ ඒ පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා 2003 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණි. | - | පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ග්‍රාමීය මාර්ග විශාල ප්‍රමාණයක් ගැසට් කිරීමට ඇති අතර එම මාර්ග මිනින්දෝරු සැලැස්මක් සහිතව කලයුතු බැවින් ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| (ii) | 126 (vii) (ඊ) වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ පවතින දැන්වීම් පුවරු සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | - | පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | දැන්වීම් පුවරු සඳහා අතුරු ව්‍යවස්ථාව සකස් කොට සභා අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) | 134 වගන්තිය . | 2015 වර්ෂයේ දියුණු ගම් ප්‍රදේශ ලෙස හඳුනාගෙන තිබූ ගම් ප්‍රදේශ 06 කින් වරිපනම් බදු අයකිරීමට 2019 මාර්තු වනවිටත් කටයුතු කර නොතිබුණි. | - | පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | මෙම ප්‍රදේශය ඇතුළත් ගුගල් සිතියම සහිත විස්තරයක් ලබා ගෙන අදාළ ප්‍රදේශයන්හි දේපල සමීක්ෂණයක් ඉදිරියේදී සිදු කිරිමට නියමිතය. |
| (iv) | 149 වගන්තිය | ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරන ලද හෝටල්, ආපනශාලා හෝ නවාතැන් පළවල් ලැබීම් මත අයකල යුතු 1% ක බද්ද එවැනි ආයතන 06 කින් වර්ෂ 17 ක් අයකර නොතිබුණි. | - | පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | | | | |
| (i) | මුදල් රෙගුලාසි 104(1)(5) | 2018 වර්ෂයේ අනතුරකට ලක් වූ සභාවේ කැබ් රථය රු. 1,950,302 ක් වැයකර 2019 වර්ෂයේ අලුත්වැඩියා කර තිබූ නමුත්, ඊට වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2,150,676 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මු.රෙ 104(3) යටතේ අලාභය පිළිබඳව ප්‍රාරම්භක වාර්තාව පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇත. ඒ අනුව පළාත් පාලන කොමසාරිස් වරයා විසින් පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 371(5) | 2002 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා නිකුත් කර තිබුණු අතුරු අග්‍රිම 105 ක් 2019 මාර්තු වනවිටත් පියවා නොතිබුණි. | 4,754,297 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | නොපියවී ඇති අත්තිකාරම් මුදල ඉදිරියේදී පියවා ගැනීමට කටයුතු කරමි. |
| (iii) | මුදල් රෙගුලාසි 571 | හිමිකම් නොපාන ලද ඉකුත් වූ තැන්පතු නියාදනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 1,300,672 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | තැන්පතු ලේඛනයට අනුව ගෙවීමට ඇති තැන්පතු වටිනාකම ඉදිරියේදී නියාදනය කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය | කොන්ත්‍රාත් 02 ක් සම්බන්ධයෙන් සභාවේ සභාපතිවරයා සහ ප්‍රාදේශීය ලේකම්වරයාගේ නියෝජිතයන් දෙදෙනෙකු ඇතුලත් ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් ප්‍රජාපාදක සංවිධානවල කොන්ත්‍රාත්කරුවන් තෝරා ගෙන නොතිබුණි. | 2,379,220 | චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | මහ සභා තීරණය අනුව බල ප්‍රදේශයේ අනුමත ප්‍රජා සංවිධාන වල හැකියාව පරීක්ෂා කර බලා ලක්ෂ 20 ට අඩු කර්මාන්ත සඳහා ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා හැකියා සහතිකය මත කර්මාන්ත ප්‍රදානය කිරීමට කටයුතු කර ඇත. |
| (ඈ) | 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | 2008 වර්ෂයේ සිට ගර්භිත කැබ් රථය අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | - | චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | අදාළ වාහනයේ ලියාපදිංචි සහතිකය ගැනීමෙන් අනතුරුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 10,086,825 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 9,520,417 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළුහිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,723,099 | 7,180,672 | 5,325,824 | 1,854,848 | 5,184,659 | 4,081,871 | 6,482,921 | 3,881,128 |
| (ii) | කුලී | 882,000 | 1,610,615 | 1,610,615 | - | 308,120 | 312,120 | 312,120 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 655,000 | 662,500 | 670,065 | - | 450,000 | 450,000 | 483,396 | - |
| (iv) | වෙනත් ආදායම් | 16,710,500 | 3,126,131 | 1,759,397 | 1,366,734 | 1,030,000 | 819,390 | - | 1,309,715 |
| | එකතුව | 23,970,599 | 12,579,918 | 9,365,901 | 3,221,582 | 6,972,779 | 5,663,381 | 7,278,437 | 5,190,843 |

### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රැස්කල වරිපනම් හා බදු ආදායම රු. 1,157,097 කින් අඩු වී තිබුණි. | සභාවේ ආදායම් නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වරිපනම් සඳහා 2019 වර්ෂයට නියමිත ඇස්තමේන්තුගත ආදායමෙන් රු. 143,740 ක මුදලක් එනම් සියයට 51 ක මුදලක් 2019 අප්‍රේල් 30 වන විට අයකර ගැනීමට මේ වනවිට කටයුතු කර ඇත. |
| (ආ) | ඉකුත් වර්ෂයේ හිඟ වරිපනම් හා බදු ශේෂයෙන් තවදුරටත් හිඟව පවතින රු. 3,398,759 ක් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සභාවේ ආදායම් නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉකුත් වර්ෂය සඳහා හිඟ වරිපනම් මුදලින් සියයට 19 ක් එනම් රු. 28,899 ක මුදලක් 2019 අප්‍රේල් 30 වනවිට අයකර ගෙන ඇති අතර ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට මේ වනවිට කටයුතු කරමින් පවතී. |

| | | |
|---|---|---|
| (ඇ) 2008 වර්ෂයේ සිට පැවත එන හිඟ ජල ගාස්තු රු. 802,142 ක් 2019 අප්‍රේල් වනවිටත් අයකරගැනීමට නොහැකි වී තිබුණි. | ආදායම් රැස් කර ගැනීමට ක්‍රියා කළ යුතු වේ. | වර්ෂ 10 කට වැඩි කාලපරිච්ඡේදයක සිට පැවත එන කිසිඳු බිල්වීමක් සිදු නොවන එහෙත් වසරක් පසා ශේෂයන් ඉදිරියට එකතු වන විසන්ධි කරන ලද අයවීම නතර වී ඇති හිඟ මුදල් සම්බන්ධයෙන් 2019 අප්‍රේල් මස මහා සභාවට ඉදිරිපත් කරනු ලැබූ අතර එම හිඟ මුදල අයකර ගැනිම සම්බන්ධව මේ වනවිටත් ඉදිරි කටයුතු කරමින් පවතී. |

2.2.3 වෙනත් ආදායම්
-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට වර්ෂ 03 කට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ කසළ ගාස්තු රු. 229,550 ක් 2019 අප්‍රේල් වනවිටත් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ආදායම් රැස්කර ගැනීමට ක්‍රියා කළ යුතු වේ. | 2018 වර්ෂයේ දෙසැම්බර් 31 වනවිට අයකර ගත යුතු හිඟ ගාස්තු වලින් කොටසක් මේ වනවිට අයකර ගෙන ඇත. ජංගම සේවා පවත්වා හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර, හිඟ කසළ ගාස්තු පවත්නා පාරිභෝගිකයින්ගෙන් කසළ ලබා ගැනීම අත්හිටු වීමටද කටයුතු කර තිබේ. |

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1. කාර්යය සාධනය
--------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, මහජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා
------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු කාරණා 30 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පැනවීමට 2019 | යෝග්‍ය අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ගොඩනැගිලි සැලසුම අනුමත කිරීම විධිමත් කිරීම හා දැන්වීම් පුවරු ගාස්තු අය කිරීම විධිමත් කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා දෙකක් සකස් කර සභා අනුමැතිය ලබා ගෙන ඇති අතර ඉදිරි |

| | | |
|---|---|---|
| මාර්තු වනවිටත් කටයුතු කර නොතිබුණි. | | කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී. ඉදිරියේදී අනෙකුත් අතුරු ව්‍යවස්ථා සැකසීමටද කටයුතු කරමි. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
-----------------------------------

| | | |
|---|---|---|
| මධ්‍යම පරිසර අධිකාරියේ රු. 10,723,047 ක ආධාර වැය කර ඉදිකර තිබුණු ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පවත්නා කාලගුණික තත්ත්වයට නොගැලපීම නිසා කොම්පෝස්ට් නිෂ්පාදනය ගැටළු සහගත වි තිබුණි. ඒ අනුව ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍යවලින් ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අපද්‍රව්‍ය වෙන්කර පරිසරයට අහිතකර නොවන පරිදි බැහැර කිරීමට ක්‍රමවේදයක් හා කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ ක්‍රමවේදයක් 2019 මාර්තු වනවිටත් සකස් කර නොතිබුණි. | නිවැරදි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘති සැලසුම් කිරීමට කටයුතු කිරීම සහ කාලගුණික තත්ත්වයට ගැලපෙන පරිදි කසළ මධ්‍යස්ථානය නවීකරණය කර ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට පත් කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිසරු ව්‍යාපෘතියේ මූලා ප්‍රතිපාදන මත ඉදිකරන ලද මෙම කසළ මධ්‍යස්ථානයේ සැකැස්ම පවත්නා කාලගුණික තත්ත්වයට නොගැලපීම නිසා කොම්පෝස්ට් නිෂ්පාදනය ගැටළු සහගත වී ඇත. මෙම මධ්‍යස්ථානයේ ප්‍රයෝගික දුෂ්කරතා මැද 2017 මැයි මස පළමු ලේයර් ඇති කිරීම සිදු කළද ක්‍රමිකව පවත්නා ප්‍රශස්ථ කාලගුණික තත්ත්වය පාලනය කල නොහැකි වීම නිසා අසාර්ථක වී ඇත. මේ වනවිට එම අඩුපාඩු මගහරවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතී. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක
--------------------------------

| | | |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්වී තිබුණද, සිය විෂයය පථයට අනුව ළඟා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු, ඒ හා සම්බන්ධවන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟා විය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධ දිගු කාලීන සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | වසර 2030 ට තිරසර සංවර්ධන ඉලක්ක වලට අනුකූලව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ ස්ථිර දැන්වීම් පුවරු 70 කින් හා බැම්මක හෝ බිත්තියක ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරු 06 කින් ගැසට් නිවේදනය ප්‍රකාරව ගාස්තු අයනොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 115,281 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. එසේම ගාස්තු අයකළ හැකි දැන්වීම් පුවරු හඳුනාගෙන ආදායම් රැස්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගැසට් නිවේදනයේ විධිවිධාන වලට අනුව කටයුතු කල යුතු වේ. | ප්‍රදේශයේ දැන්වීම් පුවරු ගාස්තු නොගෙවන ආයතන දැනුවත් කර ඇත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | පුරප්පාඩු වී තිබුණු ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා රාජ්‍ය කළමනාකරණ I ශ්‍රේණියේ නිලධාරියකු 2014 වර්ෂයේ මැයි සිට පළාත් පාලන කොමසාරිස් විසින් පත්කර තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | තෘතීය සේවා මට්ටමේ රාජ්‍ය කළමනාකරණ සහකාර අධි ශ්‍රේණියේ ලේකම් තනතුර 2008 වසරේ සිට පුරප්පාඩුව පවතී. එම තනතුර පත්කිරීම් කරනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වන අතර එම පුරප්පාඩු පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුව සෑම කාර්තුවක් පාසා දැනුවත් කර කොමසාරිස් මඟින් ප්‍රධාන ලේකම් වෙත දන්වා යවා ඇත. |
| (ආ) | පුස්තකාලයාධිපති, කාර්මික නිළධාරී තනතුරු දෙකෙහි පුරප්පාඩු හා ආයුර්වේද ඖෂධ සංයෝජක තනතුරේ පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීමෙන් අදාල කාර්යය සහ කර්තව්‍යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | පුස්තකාලාධිපති හා කාර්මික නිළධාරි තනතුරු දෙකෙහි පුරප්පාඩු හා ආයුර්වේද ඖෂධ සංයෝජක තනතුරේ පුරප්පාඩුව පිළිබඳව පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා ඇත. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂිකව බිල්කල හැකි ආදායම් තක්සේරුවකින් පසු ආදායම් ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් ඉකුත් වර්ෂ තුන සඳහා ජල ගාස්තු ආදායම් ඌන ඇස්තමේන්තුව රු. 3,556,862 ක් විය. | බිල්කල හැකි ආදායම් පිළිබඳ ඇගයීමක් කර තාත්විකව ජල ගාස්තු ආදායම් ඇස්තමේන්තු කළ යුතු වේ. | ඉදිරියේදී ජල ගාස්තු ආදායම තක්සේරු කර නිවැරදිව ඇස්තමේන්තු කිරීමට කටයුතු කරමි. |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු. 122,802,008 ක් වූ ගිණුම් විෂයයන් 4 කට අදාල දේපළ පිරියත හා උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනය හා විස්තරාත්මක උපලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | අවශ්‍ය තොරතුරු හා වාර්තා පවත්වා ගත යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

3.5.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වටිනාකම රු. 3,410,000 ක් වූ සභාවට අයත් ගලි බවුසරය අපද්‍රව්‍ය බැහැර කිරීමට ස්ථානයක් නොමැති වීමෙන් හා යන්ත්‍ර උපකරණ 03 ක් 2014 වර්ෂයේ දී අලුත්වැඩියාවකට භාරදී නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබීම නිසා නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් ප්‍රයෝජනවත් ආකාරයට යෙදවීමට ක්‍රියා කළ යුතු වේ. | සභාව සතු වයිබ්‍රේටර් රෝල හා ප්ලේට්කම්පැක්ටර් යන්ත්‍රය අලුත්වැඩියාවෙන් පසු භාවිතයට යෙදවීමට කටයුතු කරමි. ගලි බවුසරය ප්‍රයෝජනයට ගත හැකි පළාත් පාලන ආයතනයකට ලබා දීමට කටයුතු කරමි. |
| (ආ) පුරනැගුම ව්‍යාපෘතිය මඟින් ඉදිකර 2016 වර්සයේදී සභාවට භාර දෙන ලද පිරිවැය රු. 42,000,000 ක් වූ ගලගම බහු කාර්ය ගොඩනැගිල්ලේ ආයුර්වේද සායනයන් හා සභාවේ විවිධ | ගොඩනැගිල්ල ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | ගලගම බහු කාර්ය ගොඩනැගිල්ල තුළ මසකට වරක් ආයුර්වේද සායනයක් සහ සභාව සංවිධානය කරනු ලබන විවිධ රැස්වීම් පවත්වනු ලබයි. මෙම ගොඩනැගිල්ල සංචාරක ක්ෂේත්‍රයේ ආදායම් |

| | | |
|---|---|---|
| රැස්වීම් පවත්වා තිබුණද මුළුතැන් ගෙයක් නොමැති වීමෙන් අදාළ කාර්යයන්ට යොදවා ගැනීමට නොහැකි වී තිබුණි. | | උත්පාදනය කිරීමේ ව්‍යාපෘතියකට යෙදවීම සඳහා අත්‍යාවශ්‍ය ව ඇති මුළුතැන් ගෙයක් ඉදිකිරීමට ව්‍යාපෘති වාර්තා සකස් කර සබරගමුව පළාත් සභාවට යොමු කර ඇත. |

3.6 ප්‍රසම්පාදනය

----------------

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වැනි පරිච්ඡේදයේ 4.2.1(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබියදී රු. 2,196,353 ක ප්‍රසම්පාදනයන් සිදු කර තිබුණි. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | රජයේ ප්‍රසම්පාදන සංග්‍රහය අනුව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |

3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කැපොක්වත්ත කසළ කළමනාකරණ පරිශ්‍රයේ ඇති කොන්ක්‍රීට් මාර්ග තලයේ වර්ග මීටර් 11.55 ක කොටසක් කැඩී මාර්ගයෙන් පිටතට තල්ලු වී තිබුණද, රු. 83,652 ක රැඳවුම් මුදල් භාවිතා කර පිළිසකර කිරීමට 2019 මාර්තු වනවිටත් කටයුතු කර නොතිබුණි. | රඳවා ගැනීමේ මුදල් භාවිතා කර හෝ මාර්ගය පිළිසකර කිරීමට කටයුතු කළ යුතු වේ. | 10% ක රැඳවුම් මුදලින් ඉදිරියේදී මාර්ග තලයේ කැඩී ගොස් ඇති කොටස් පිළිසකර කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල සභාවේ පුනරාවර්තන වියදම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. මිලියන 40.55 ක් වූ අතර එහි තත්‍ය වියදම රු. මිලියන 51.58 ක් වීමෙන් ප්‍රතිපාදන ඉක්මවා රු. මිලියන 11.03 ක් වැයකර තිබුණි. ප්‍රාග්ධන වියදම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන රු. මිලියන 4.38 ක් වූ අතර එහි තත්‍ය | අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමු කර ඇස්තමේන්තු සකස් කළ යුතු අතර එම ඉලක්ක සපුරා ගැනීමටද ක්‍රියා කල යුතු වේ. | අයවැයගත ඇස්තමේන්තුවට වඩා වියදමක් දැරීමට සිදුවන අවස්ථාවකදී පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් සභාවේ අනුමැතිය ලබා ගෙන වියදම් කිරීමට අදාළ අංශ දැනුවත් කරන ලදී. |

වියදම රු. මිලියන 5.77 ක් වීමෙන් ප්‍රතිපාදන ඉක්මවා රු. මිලියන 1.38 ක් වැයකර තිබුණි.

4. 2 නොවිසඳී ඇති විගණන ඡේද

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු බෙලිහුල්ඔය "දිය පහස" ගිමන්හල පරිශ්‍රය තුළ බදුකරු විසින් සභාවේ අවසරයකින් තොරව 2014 වර්ෂයේ ඉදිකළ ගිමන්හලේ ඉදිකිරීම සම්බන්ධයෙන් සභාපතිගේ උපදෙස් මත 2015 වර්ෂයේ දී තක්සේරුවක් සිදුකර රු. 289,682 ක් බදුකරු වෙත ගෙවා තිබුණි. සභා අරමුදලට නීත්‍යානුකූල නොවූ මෙම ගෙවීමෙන් රු. 72,000 ක් බදුකරු විසින් ආපසු ගෙවා තිබූ නමුත් ඉතිරි රු. 217,682 ක් අයකර ගැනීමට 2019 මාර්තු වනවිටත් කටයුතු කර නොතිබුණි. | ඉදිකිරීම් පිළිබඳ පරීක්ෂාකර වාර්තාවක් ලබාගෙන ඒ අනුව කටයුතු කළ යුතු වේ. | ඉදිකිරීම්වල පවත්නා තත්ත්වය පිළිබඳ පරීක්ෂා කර එහි පිරිවැය ඇස්තමේන්තු කර සභාවට අය විය යුතු මුදල් අයකර ඉතිරිය බදුකරුට ගෙවා ඇත. ගොඩනැගිල්ල දැනට ප්‍රයෝජනයට ගනිමින් පවතී. එබැවින් සභාවට පාඩුවක් සිදු වී නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | පඹහින්න සති පොළ සංවර්ධනය සඳහා 2015 සහ 2017 වර්ෂයන්හිදී රු. 4,561,397 ක් වැයකර තිබුණද, පොළ පැවැත්වීමට සුදුසු පරිදි සංවර්ධන කටයුතු සිදුකර නොතිබීම හේතුවෙන් පඹහින්න මංසන්ධියේ සිට පඹහින්න කුඹල්ගම මාර්ගයේ මාර්ග උරහිසෙහි සති පොළ පවත්වන බැවින් වෙළෙඳුන් හා පාරිභෝගික ජනතාව වර්ෂාවෙන් හා වාහන තදබදයෙන් දැඩි අසීරුතාවයට හා අවදානමකට මුහුණ දීමට සිදු වී තිබුණි. | සතිපොළ සංවර්ධනය කර ප්‍රයෝජනයට ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | 2015 හා 2017 වර්ෂවලදී ප්‍රාදේශිය සභා ශක්තිමත් කිරිමේ වැඩසටහන යටතේ පළාත් පාලන අමත්‍යාංශය මඟින් ලබා දුන් ප්‍රතිපාදන වලින් රු. 4,561,397 ක් වැයකර බැම් යොදා භූමිය සකස් කිරීම වැසිකිලි පද්ධතියේ ඉදිකිරීම දෙමහල් ගොඩනැගිල්ලක පළමු මහල ඉදිකිරීම හා ජල සැපයුම ලබා දීම සිදු කර ඇත. 2018 වසරේ මෙම පොළ භූමයේ ඉතිරි වැඩ නිම කිරිම සඳහා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ලැබුණු පසු සතිපොළ වෙළදුන්ට පරිහරණය කළ හැකි පරිදි සකස් කිරිමට කටයුතු කරමි. |